




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## සිහින

සුරා පැන් කඳුළු බඳුනේ දියර සිහින
සෝම දුම් සුසුම් නළයේ වායු සිහින
අපට පේන - අප සනහන
'සුදනනි' ඔබ එපා කියන

හැඟුම් බමරු සිර කොට බැඳි බැමි ලිහන
සොවින් දැවෙන පැලි දිවි පොළවට වහින
සවස සිතඟුරෙහි ගැල්වෙන මල් තුහින
සොඳුරු මධු පොදේ පෑදේ රත් සිහින

දෑඟිලි-දෙතොල්-නැහැ පුඩු අතරෙහි සරන
කාන්සියේ නෙකලස සිතිවිලි පිසින
දිගු සිත එකරමුණු දැහැනක තනි කරන
ධූම ළා රලේ බිඹු වේ සුදු සිහින

නිතිනි සිහිල ඉහින සිහින
පිවිස සිතෙහි හමන සිහින
නොදැක-නොවිඳ-නොසිඹ-නොලැබ
කිම ගරහනු 'සුදනනි' ඔබ

**ලක්ශාන්ත අතුකෝරල**
( 'ඊ' කාව්‍ය සංග්‍රහය - 2014 )

සිහිනවලට අර්ථ දැක්වීම් රාශියක් ඇත. නැතහොත් සිහින විවිධාකාරයෙන් අර්ථ දක්වාගත හැක. එනිසාම නා නා තේරුම් අනුව ඒවා වර්ගීකරණයටද ලක්වේ. එනමුදු වාස්තවිකව අපේ අතට හසුනොවන මේ සිහිනවලට වාස්තවිකත්වයක් ආරෝපණය කරමින් අලුත් අයුරකින් ඒවාට අර්ථ දැක්වීම් දෙන්නට ලක්ශාන්ත ගන්නා තැතක් මේ කවියේ දක්නට ලැබේ. ඔහු කවිය පටන් ගන්නේම මෙන්න මේ සිහිනවලට ඇති අලුත්ම වාස්තවික මානයක් එනම්, ඝන-ද්‍රව-වායු ඈ භෞතිකවාදී විවරණයක් නැතහොත් තත්ත්වයක් අපට අර්ථ නංවමිනි. එය ඉතා නැවුම් අපූර්ව ප්‍රවේශයකි. අපි එදිනෙදා දකින මේ සිහිනවලට මේ තත්ත්වය උදාවූයේ කෙසේදැයි යන්න දැන් සලකා බැලිය යුතුය.

සුරා පැනින් පිරුණු බඳුනකට 'කඳුළු බඳුනක්' යැයි නම් දෙන අප කවියා එහි පිරී ඉතිරෙන්නේ 'දියර සිහින' බව කියයි. දැල්වුණු දුම්වැටියක් 'සුසුම් නළයක්' යැයි නම් කරන හේ එහි තියෙන්නේ 'වායු සිහින' බව කියයි. ඒත් එක්කම කුඩු, කැට හෝ ගුලි වශයෙන් ඇති වෙනත් මතක් ගැන 'ඝන සිහින' යැයි නොකියන්නටද හේ ප්‍රවේසම් වේ. කෙසේ හෝ ඔහුට වඩාත්ම හුරු පුරුදු සිහින දෙවර්ගයක් ඔස්සේ මේ කවිය එතැන් පටන් ගලා යන්නට ගනී. බඳුනක පිරුණ සුරාවටත්, වැටියකින් මුදා හැරෙන දුම් වළල්ලකටත් කෙනෙකුට බැලූ බැල්මට පෙනෙන දේට එහායින් තියෙන වෙනත් මානයක අර්ථයන් තියෙන්නට පුළුවන. සුරාව කඳුළකටත් ධූමය සුසුමකටත් අර්ථ ගැන්වුවද එය, එය පාවිච්චි වන්නන් තුළ සහනයක් ඇති නොකරන්නේද? නොසනසන්නේද? නමුදු අප කවියාට අනුව මෙය කියවා ගන්නේ නම්, සාම්ප්‍රාදායික සංස්කෘතික සමාජමය 'සුදනන්' විසින් මෙය නිතරම ගැරහීමට ලක්වන, වාරණයට ලක්වන දෙයක් බව කියා පායි. නමුදු ඒවාට ඇහුම්කන් දීමෙහි වැදගැම්මක් නැති බව පෙනී යන්නේ ඔවුන් එපා කිව්වද, කෙසේ හෝ වෙනත් ආකාරයකින් වෙනත් කෙනෙකුට ඒ දේ 'සැනසීම' ලබා දෙන බැවිනි. මේ මංමාවත් දෙවර්ගයම අප තුළ පරිකල්පනීය සිහින ලෝකයක් තනා දෙයි.



ඉතින් භාවිතා වන මාධ්‍යය අනුව විටින් විට නිර්මාණය වන සිහිනයන් දියර හා වායු ලෙස නම් කිරීම ඉතා අපූරු සිහින වර්ගීකරණයකි.

මේ කවියේ අනුභූතියේ විශාල අපූර්වත්වයක් නොමැති වුවත්, ඒ අනුභූතියට පදනම් වන සමාජ දේශපාලන කාරනා ගැන ගැඹුරු ජීවන සත්තාවක් පිළිබඳ විනිවිද යන තියුණු දැක්මක් නොමැති වුවත්, ඒ දෛනික සංසිද්ධිවලට කවියා විසින් දෙන්න හදන මායාමය අර්ථයන් ඉතා අපූරුය. එය මේ ගැන ලියන්නට අපව පොළඹවන ලදී.

කවියේ දෙවැනි කොටසට හැරෙමු. මෙය පළමු කවියේම කොටසක උප වර්ගීකරණයක් බඳුය. 'දියර සිහින' ලෙස අර්ථ ගැන්වුණු සුරාව ගැන ජීවිතය දෙසට හැරී ලබා දෙන යම් විවරණයක් බඳුය. මේ සමාජය තුළ ජීවත් වද්දි අපි බොහෝ දේ පිටට නොකියන්නෙමු. අපේ හිත් තුළම ඒවාට පැසව පැසවා ඉන්නට ඉඩහැර නිශ්ශබ්දතාවයම රකින්නට පුරුදු වී සිටින්නෙම; එහෙයින්ම විඳවන්නෙමු. අපේ සියලු හැඟීම් සමුදායන් අප ඇතුළේම සිරකරගෙන එකිනෙකාට විවෘත නොවී ඔහේ කාලය ගෙවා දමන්නෙමු. නමුත් මේ චර්යාව ඉඳහිට හෝ වෙනස් වන, මෙන්න මේ හැඟුම් ටික ටික එළියට මුදා දමන මොහොතක් අපටත් ඇත. ඒ සොඳුරු මධු පොදක රසෙහි ගිලෙමින් ටිකෙන් ටික මතින් මතට ලැබෙන සැහැල්ලුව ඔස්සේය. එවිට ඉතාම නිහඬ පුද්ගලයා වුව කතාබහ කරන්නට පටන් ගනී. ඔහුගේ අභ්‍යන්තරය බිඳෙන් බිඳ විෂද කරමින් අනුන් වෙත ඇරෙමින් ලිහෙමින් විවෘත වෙමින් මේ කතාබහ තව තවත් දිග්ගැස්සේ. අප කවියා කියන්නේ බැඳ දමා සිරගත කළ හැඟුම් බමරුන් ගේ බැමි ලිහා උන්ව නිදහස් කරන්නට මේ සුරා මත උදව් වන බවයි. එය ශෝකයෙන් දැවෙන පැලි වළං පැළුණ කර්කශ පොළවට වහින වට වැස්සක් බවයි; හවස් කාලයට වේදනාවෙන් ගිනිගෙන පුපුරු නැගෙන සිත් කිහිරඟුරු මත වැටෙන මල් තුහින වැස්සක් බවයි.

ඉදින් මේ මත් පොද සොඳුරුම මධු පොදක් වන්නේ මේ අර්ථයෙන් නොවේද? අවසානයේ ඔහු කියන්නේ ඒ සොඳුරු මධුවිත අපට ගෙනත් දෙන්නේ 'රත් සිහින' බවයි. ඒ රත් සිහින මොනවාදැයි අපි නොදනිමු. නමුත් දියර සිහින ලෙස ඇරඹී රත් සිහින ලෙස අර්ථ ගැන්වෙන මේ සිහින අපගේ හැඟුම් අවුළුවා ලූ බිඳෙන් බිඳ පරිපූර්ණත්වයට පත්වන සිහිනමය තත්ත්වයක් බව නම් ඉතා පැහැදිළිය. මේ කර්ණ කටුක සමාජයේ මෙවැනි දෙයක් වත් නැතුව කොහොම ජීවත් වන්න දැයි සිතෙන තරමටම මේවා අපේ ජීවිත සමග අනන්‍ය වේ; නිරන්තරයෙන්ම බැදේ. ඉතින් මේවා ගැන නොලියා කොහොමද?

දුම්වැටියක් අපගේ ශරීරස්ථාන කිහිපයක් එකවිට ස්පර්ෂ කරයි. දෑඟිලිවලට සිරවී දෙතොල්වලින් තෙරපී පෙනහලු ඔස්සේ නැහැ පුඩු තුළින් ධූමයක් සේ නික්ම යයි. අවසානයේ මනැසේ කොහේ හෝ තැනක් ස්පර්ෂ කරයි. 'සුදනන්' ගේ වදනක් කැඳවනවා නම් දුම්බීම ශරීරයට අහිතකරය; පිළිකා ඇති කරයි. නමුත් කථකයාට ඒවායේ වැදගත්කමක් තියෙද? ඔහු විඳින්නේ ඒ සෝම දුම් රැළි අතර ගෙවීයන මොහොතේ ඔහුගේ සිතට අත්වන සැහැල්ලුවම විනා අනෙකක් නොවේ. කාන්සියෙන් බරවුණු මොහොතක හදේ සිතිවිලි එක්ක තනිවන්න පොඩි හරි ඉඩක් තනා දෙන්නේ මේ දුම්වැටිය නොවේද? දාස් ගණන් සිතිවිලි එක රොත්තට වැල නොකැඩී පෙරළි පෙරළී එන විට දිගු සිත එක අරමුණක රඳවා ගන්නට මේ දුම් රැළි උදව් වේ. අවසානයේ අප කවියා කියන්නේ අර මුලින් කියූ ලෙසම වායුමය සිහින ලෙස මතුවී, ළා ධූම රැළි මතින් තැනෙන පරිකල්පනීය තත්ත්වය 'සුදු සිහින' බවයි. එය ඉතාම නිච්චිව තැන්පත් සැහැල්ලුමය තත්ත්වයක් අපටත් දැනෙන්නට ඉඩ හරියි. සොඳුරු මධු පොදෙන් ලැබෙන 'රතු සිහිනමය' උත්තේජනයත්, ළා දුම් රළෙන් මැවෙන 'සුදු සිහිනමය' නිස්කාන්සුවත් යන දෙකම ජීවිතයේ දී මිනිසෙකුට අවැසිය. ඒ දෙකම අපේ සිතිවිලිත් සමඟ වඩා විවෘතව හැඟීම් ගනුදෙනුවක යෙදෙන්නට, අන්තර්භාෂණයක යෙදෙන්නට පාලම් තනා දේ. සුදනනි, ඔබ වැරදිලාවත් මේ පාලම්වලට ගොඩනොවන්නේ නම් යෙහෙකිය. මේ කවිය ගැන අපේ හැඟීම් මාත්‍රයන් ලියද්දී 'සුදනන්ට' කියන්නට අපටත් දෙයක් ඇත. එනම්, අපි මේ කවියේ ලියා ඇති රසය අපට පුළුවන් ලෙස උකහා ගන්නවා විනා ඔබටත් මේ සිහිනවල සරන්නට යැයි යෝජනා නොකරන්නෙමු. ඔබත් 'සුදනෙක්' කියා ඔබට හිතෙනවා නම් මෙය නොකියවා ගියාට අපේ හිතේ කිසිදු අනාදරයක් තරහක් නැත.

අවසාන කවිය කිසියම් සමෝධානාත්මක ප්‍රවේශයකින් මෙය තේරුම් ගන්නට අපට ඉඩ විවර කරයි. නිරන්තරයෙන් හදට සිහිල ඉසිමින්, සිතට ඇතුළු වී සිතෙහිම සරන මේ සිහින 'සිහිනම' වේ. තව දුරටත් වෙන් වෙන් වශයෙන් ගෙන ඒවා වර්ගීකරණගත කොට පටලවා ගත යුතු නැත. මේ කුමන මාවතකට පිවිසුණත් ඔබට අවසානයේ ඉතිරි වන්නේ සිත නිවන සිහින බව අප කවියා පුනරුච්චාරණය කරයි. ඉතින් ඔහු අවසානයේ ප්‍රශනයක් අසා නතර වේ. ඒ අපෙන් නොවේ; 'සුදනන්' ගෙනි.

මිනිහෙකුගේ පර්කල්පනීය ලෝකයට අවශ්‍ය පරිසරය තනා දෙන මේ පුංචි මංමාවත් වලට නොපිවිසී, ඒවා නොදැක-නොවිඳ-නොසිඹ-නොලැබ ගරහන්නේ ඇයි කියාය. අහිංසක ප්‍රශ්නාර්ථයක ස්වරයකින් එහාට ගොස් අප කවියා අසන දෙයෙහි කිසියම් සියුම් තර්ජණාත්මක බවක්ද ඇත. එනම්, මේ රතු සුදු සිහින අතර සරන්නට ඔබ අකමැති නම් ඒවාට නොගරහා පැත්තකට වී සිටින ලෙසයි. ගරහන්න පෙර ඒ සිහින අතර සරා ඒ නම් කුමන ආශ්චර්යාත්මක අත්දැකීමක් දැයි විඳගෙන, පසක් කොටගෙන එය අභියෝගයට ලක් කරන ලෙසයි.

අවසාන වශයෙන් කීමට ඇත්තේ, ඉතාම සුලබ අත්දැකීමකට නැවුම් අර්ථ නිරූපණයන් දී ඒ තුළින් සාම්ප්‍රදායික ශිෂ්ටාරගත 'සදාචාරත්වය' ප්‍රශ්න කරන මේ කවිය 'සුදනන්ට' අසාත්මික විය හැකි බවයි.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com